# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2119/3 - 2019 අප්‍රේල් මස 17 වැනි බදාදා - 2019.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 11/80 (29)

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2019 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2019 ආහාර (සීනි, ලුණු සහ මේදය සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2019 ජූනි මස 01 වන දින ක්‍රියාත්මකභාවයට පත්වනු ලැබේ.

2. (1) කිසිදු තැනැත්තකු විසින් -

(අ) මෙහි I වන උපලේඛනයේ අ කොටසේ නිශ්චිතව දක්වා ඇති සීනි ප්‍රමාණය ; හෝ

(ආ) මෙහි I වන උපලේඛනයේ ආ කොටසේ නිශ්චිතව දක්වා ඇති ලුණු ප්‍රමාණය ; හෝ

(ඇ) මෙහි I වන උපලේඛනයේ ඇ කොටසේ නිශ්චිතව දක්වා ඇති මේද ප්‍රමාණය,

අන්තර්ගත වන යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක්, මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ලේබල් කර ඇත්නම් මිස ඇසුරුම් කිරීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, හෝ ප්‍රචාරණය කිරීම නොකළ යුතු ය.

(2) යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක, බහාලුවක ලේබලයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන වලට අනුව, එම ආහාරය පරිභෝජනයට පෙර සකස් කිරීම හෝ නැවත සකස් කිරීම කළ යුතු වන අවස්ථාවක දී සහ එසේ සකස් කිරීම හෝ නැවත සකස් කිරීම මත එම ආහාරයේ ඝන හෝ අර්ධ ඝන ස්වභාවය තවදුරටත් නොවෙනස්ව පවතින්නේ නම් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීනි, ලුණු හෝ මේදය ප්‍රමාණය අන්තර්ගත නම් -

1A - PG 4488 — 3017 (2019/04)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(අ) දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඝන හෝ අර්ධ ඝන ආහාරයක් වන අවස්ථාවක දී එම ආහාරය අන්තර්ගත වන බහාලුව අදාළ වන පරිදි, මෙම නියෝගයේ දැක්වෙන ආකාරයට ලේබල් කරනු ලැබිය යුතුය ;

(ආ) ආනයනය කරන ලද ඝන හෝ අර්ධ ඝන ආහාරයක් වන අවස්ථාවක දී මෙම නියෝගයට අනුකූලව සකස් කරන ලද ලේබලයක් එම ආහාරය අන්තර්ගත බහාලුවේ අලවා තිබිය යුතු ය.

3. මෙහි I වන උපලේඛනයේ "අ" කොටසේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති සීනි ප්‍රමාණය යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක අන්තර්ගත වන අවස්ථාවක දී, එම ආහාරය අන්තර්ගත බහාලුවේ හෝ ඇසුරුමේ පහත පරිදි විය යුතු ලාංඡනයක් තිබිය යුතු ය :-

(අ) මෙහි I වන උපලේඛනයේ "අ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි ලාංඡනයේ උස සහ පළල පිළිවෙළින් සෙ.මී. 2 කට සහ සෙ.මී. 1 කට නොඅඩු විය යුතු ය ;

(ආ) මෙහි I වන උපලේඛනයේ "අ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි "සීනි" යන වචනය සහ සුදු අකුරින් පිළිවෙළින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ලාංඡනය තුළ ප්‍රදර්ශනය කළ යුතු අතර, අවම මි.මී. 2 ප්‍රමාණයේ අකුරින් විය යුතු ය ;

(ඇ) මෙහි I වන උපලේඛනයේ "අ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි සුදු කොටුවක් තුළ එම ආහාරයේ අන්තර්ගත සීනි ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක විස්තරයක් තිබිය යුතු අතර, එය අවම මි. මී. 1.5 ප්‍රමාණයේ සහ කළු අකුරෙන් විය යුතු ය ; සහ

(ඈ) ලාංඡනයේ වර්ණ සංකේතය මෙහි I වන උපලේඛනයේ "අ" කොටසේ II වන තීරයේ නිශ්චිතව සඳහන් පරිදි විය යුතු ය ·

4. මෙහි I වන උපලේඛනයේ "ආ" කොටසේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ලුණු ප්‍රමාණය යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක අන්තර්ගත වන අවස්ථාවක දී, එම ආහාරය අන්තර්ගත බහාලුවේ හෝ ඇසුරුමේ පහත පරිදි විය යුතු ලාංඡනයක් තිබිය යුතු ය :-

(අ) මෙහි I වන උපලේඛනයේ "ආ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි ලාංඡනයේ උස සහ පළල පිළිවෙළින් සෙ.මී. 2 සහ සෙ.මී. 1 කට නොඅඩු විය යුතු ය ;

(ආ) මෙහි I වන උපලේඛනයේ "ආ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි "ලුණු" යන වචනය සහ සුදු අකුරින් පිළිවෙළින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ලාංඡනය තුළ ප්‍රදර්ශනය කළ යුතු අතර, අවම මි.මී. 2 ප්‍රමාණයේ අකුරින් විය යුතු ය ;

(ඇ) මෙහි I වන උපලේඛනයේ "ආ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි සුදු කොටුවක් තුළ එම ආහාරයේ අන්තර්ගත ලුණු ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක විස්තරයක් විය යුතු අතර, එය අවම මි. මී. 1.5 ප්‍රමාණයේ සහ කළු අකුරින් විය යුතු ය ; සහ

(ඈ) ලාංඡනයේ වර්ණ සංකේතය මෙහි I වන උපලේඛනයේ "ආ" කොටසේ II වන තීරයේ නිශ්චිතව සඳහන් පරිදි විය යුතු ය.

5. මෙහි I වන උපලේඛනයේ "ඇ" කොටසේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති "මේදය" ප්‍රමාණය යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක අන්තර්ගත වන අවස්ථාවක දී, එම ආහාරය අන්තර්ගත බහාලුවේ හෝ ඇසුරුමේ පහත පරිදි විය යුතු ලාංඡනයක් තිබිය යුතු ය :-

(අ) මෙහි I වන උපලේඛනයේ "ඇ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි ලාංඡනයේ උස සහ පළල පිළිවෙළින් සෙ.මී. 2 සහ සෙ. මී. 1 කට නොඅඩු විය යුතු ය ;

(ආ) මෙහි I වන උපලේඛනයේ "ඇ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි "මේදය" යන වචනය සහ සුදු අකුරින් පිළිවෙළින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ලාංඡනය තුළ ප්‍රදර්ශනය කළ යුතු අතර, අවම මි. මී. 2 ප්‍රමාණයේ අකුරින් විය යුතු ය ;

(ඇ) මෙහි I වන උපලේඛනයේ "ඇ" කොටසේ III වන තීරයේ නිරූපිත පරිදි සුදු කොටුවක් තුළ එම ආහාරයේ අන්තර්ගත "මේද" ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක විස්තරයක් තිබිය යුතු අතර, එය අවම මි.මී. 1.5 ප්‍රමාණයේ සහ කළු අකුරෙන් විය යුතු ය ; සහ

(ඈ) ලාංඡනයේ වර්ණ සංකේතය මෙහි I වන උපලේඛනයේ "ඇ" කොටසේ II වන තීරයේ නිශ්චිතව සඳහන් පරිදි විය යුතු ය.

6. ලාංඡන, මෙහි II වන උපලේඛනයේ දැක්වෙන පරිදි එම ආහාර අන්තර්ගත වන බහාලුවේ හෝ ඇසුරුමේ ලේබලයේ ප්‍රධාන රාමුවේ එකිනෙකට ආසන්නව ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, අදාළ ලාංඡන එම ආහාරය අන්තර්ගත වන බහාලුවේ හෝ ඇසුරුමේ ප්‍රධාන රාමුවෙහි වර්ගඵලයෙන් 25% කට වඩා ආවරණය කරන අවස්ථාවක දී, එම ලාංඡන තොග ඇසුරුමේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

7. මෙම නියෝග වල සඳහන් විධිවිධාන :-

(අ) යම් ප්‍රාථමික කෘෂිකාර්මික නිෂ්පාදනයක් ;

(ආ) වෙන් වෙන් වූ ඇසුරුම්වල බහා අලෙවි කරන කුළුබඩු, කුළුබඩු මිශ්‍රණ, ව්‍යංජන මිශ්‍රණ සහ රසකාරක මිශ්‍රණ ;

(ඇ) විශේෂ පෝෂණ අවශ්‍යතාවයන් සඳහා භාවිතා කරනු ලබන ආහාරයක් හෝ වෛද්‍ය උපදෙස් හෝ වෛද්‍යවරයකුගේ නිර්දේශ මත භාවිතා කළ යුතු බවට ඇසුරුම් ලේබලයේ පැහැදිලිව ප්‍රදර්ශනය කර ඇති ආහාරයක් ;

(ඈ) ගැනුම්කරු විසින් ඉල්ලා සිටින ලද ස්වභාවයේ, තත්වයේ, ප්‍රමාණයේ, ප්‍රභවයේ හෝ වෙළඳ නාමයෙන් වූද, ගැනුම්කරු ඉදිරිපිට දී කිරන ලද, ගණනය කරන ලද හෝ මනින ලද ආහාරයක් හෝ එවැනි යම් ආහාර ඇසුරුමක් ;

(ඉ) මෙම නියෝග වලට අනුකූල වූ සිල්ලර ඇසුරුම් අන්තර්ගත වන තොග ඇසුරුම් පිළිබඳව වන අවස්ථාවක දී එවැනි තොග ඇසුරුම් ;

(ඊ) ළදරු කිරිපිටි වට්ටෝරු ;

(උ) අපනයනය සඳහා පමණක්ම අසුරන ලද නිෂ්පාදන ;

(ඌ) යම් ඝන හෝ අර්ධ ඝන ආහාර බහාලුවක ලේබලයේ නිශ්චිතව විධාන කර ඇති පරිදි සකස් කිරීම හෝ නැවත සකස් කිරීම මත, පරිභෝජනය කරන අවස්ථාවේ දී දියරයක් බවට පත් වන යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක් ; හෝ

(එ) මෙම නියෝග ක්‍රියාත්මකභාවයට පත්වන දිනයට පෙර නිෂ්පාදනය කරන ලද යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක්,

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නියෝගයන්හි -

"ඇම්බර්" යන්නෙන්, ආර් 255, ජී 195 සහ බී 9 යෙන් යුත් රතු, කොළ හා නිල් වර්ණ ක්‍රමය (ආර්ජීබී) හෝ වෙනත් ක්‍රමයකින් අදාළ තීව්‍රතාවය අදහස් වේ.

"මේද" යන්නෙන්, ට්‍රයිග්ලිසරයිඩ ආකාරයෙන් අන්තර්ගත වන මුළු මේද අම්ල ප්‍රමාණය අදහස් වේ ;

"කොළ" යන්නෙන් රතු, කොළ හා නිල් වර්ණ ක්‍රමයෙන් (ආර්ජීබී) ජී 195 හෝ වෙනත් ක්‍රමයකින් අදාළ තීව්‍රතාවය අදහස් වේ.

"ප්‍රධාන රාමුව" හෙවත් "ඇසුරුමේ ඉදිරිපස" යන්නෙන්, සිල්ලර වෙළඳාම සඳහා වන ප්‍රදර්ශනය කිරීමේ පිළිගත් ක්‍රමවේදයක් යටතේ ප්‍රදර්ශනය කිරීමට, ඉදිරිපත් කිරීමට, පෙන්වීමට හෝ පරීක්ෂා කිරීමට බොහෝදුරට ඉඩ ඇති ලේබලයේ කොටස අදහස් වේ.

"ප්‍රාථමික කෘෂිකාර්මික නිෂ්පාදන" යන්නට, ධාන්‍ය, රනිල බෝග, එළවළු, මුලාභ හා ස්කන්ධාභ, පළතුරු, ලුණු, සීනි, මස්, මාළු, ඇතුළත් වේ ;

"රතු" යන්නෙන්, රතු, කොළ හා නිල් වර්ණ ක්‍රමයෙන් (ආර්ජීබී) ආර් 230 හෝ වෙනත් ක්‍රමයකින් අදාළ තීව්‍රතාවය අදහස් වේ.

"ලුණු" යන්නෙන්, සෝඩියම් ක්ලෝරයිඩ ($NaCl$) ආකාරයෙන් ආහාරවල අන්තර්ගත වන මුළු ලුණු ප්‍රමාණය අදහස් වේ ; සහ

"සීනි" යන්නෙන්, මොනොසැකරයිඩ්ස් සහ ඩයිසැකරයිඩ්ස් ආකාරයෙන් ආහාරවල අන්තර්ගත වන මුළු සීනි ප්‍රමාණය අදහස් වේ.

## I වන උපලේඛනය

(2,3,4 සහ 5 නියෝග)

"අ" කොටස

### ඝන හෝ අර්ධ ඝන ආහාර වල අඩංගු මුළු සීනි ප්‍රමාණය

| I වන තීරුව<br>මුළු සීනි ප්‍රමාණය<br>(ග්‍රෑම් 100 කට) | II වන තීරුව<br>ලාංඡනයේ වර්ණ සංකේතය | III වන තීරුව<br>ලාංඡනය |
|---|---|---|
| ග්‍රෑම් 22 ට වැඩි | රතු |  |
| ග්‍රෑම් 5 සිට ග්‍රෑම් 22 දක්වා | ඇම්බර් |  |
| ග්‍රෑම් 5 ට වඩා අඩු | කොළ |  |

"ආ" කොටස

සන හෝ අර්ධ ඝන ආහාර වල අඩංගු ලුණු ප්‍රමාණය

| *I* වන තීරුව<br>මුළු ලුණු ප්‍රමාණය<br>(ග්‍රෑම් 100 කට) | *II* වන තීරුව<br>ලාංඡනයේ වර්ණ සංකේතය | *III* වන තීරුව<br>ලාංඡනය |
|---|---|---|
| ග්‍රෑම් 1.25 ට වැඩි | රතු |   |
| ග්‍රෑම් 0.25 සිට ග්‍රෑම් 1.25 දක්වා | ඇම්බර් |   |
| ග්‍රෑම් 0.25 ට වඩා අඩු | කොළ |   |

"ඇ" කොටස

ඝන හෝ අර්ධ ඝන ආහාර වල අඩංගු මේද ප්‍රමාණය

| *I* වන තීරුව<br>මුළු මේද ප්‍රමාණය<br>(ග්‍රෑම් 100 කට) | *II* වන තීරුව<br>ලාංඡනයේ වර්ණ සංකේතය | *III* වන තීරුව<br>ලාංඡනය |
|---|---|---|
| ග්‍රෑම් 17.5 ට වැඩි | රතු |  |
| ග්‍රෑම් 3 සිට ග්‍රෑම් 17.5 දක්වා | ඇම්බර් |  |
| ග්‍රෑම් 3 ට වඩා අඩු | කොළ |  |

## II වන උපලේඛනය

(6 වන නියෝගය)




05 - 02